# 2023 ක් වූ ජනවාරි මස පවත්වන ලද අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව

දිනය :- 2023.01.03

වේලාව :- පෙ.ව 9.30

ස්ථානය :- අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් ශාලාව

මුලසුන :- ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී. ජී. සිරිමල් විජේතුංග මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්. එෆ්. එම්. අජ්මීර් මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. එච්. ජී. එස්. එම්. මිහුරාර් මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්. නිලාම් මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එච්.එම් සව්රාජ් මැතිතුමා |
| 11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා |
| 12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.යූ. රහ්මාන් මැතිතුමා |
| 13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එච්.එම් නසාර් මැතිතුමා |
| 14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.ජී. ගාමිණී වසන්ත කුමාර මැතිතුමා |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඒ. ජී. ස්වර්ණලතා මැතිතුමිය |
| 16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි | - | එස්. ආර්. එම්. ඉස්මයිල් මැතිතුමිය |
| 17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | බී.කේ.ජී. සීලවතී මැණිකේ මැතිතුමිය |
| 18.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.එස්.එම්. හස්වර් මැතිතුමා |
| 19.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.ජී. නිල්මිණී දමයන්ති මැතිතුමිය |
| 20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එෆ්. නිස්රිනා ෂරුක් මැතිතුමිය |
| 21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා |
| 22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්. එම්. නිහිමතුනිසා මැතිතුමිය |
| 23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා |
| 24.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ජී. නිරංජන් කරුණාරත්න මැතිතුමා |
| 25.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා |
| 26.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ආර්.එම් සරුක් මැතිතුමා |
| 27.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | යූ.එස්.එම් හුසෙයින් මැතිතුමා |
| 28.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම් ශාන්ත සෙනවිරත්න මැතිතුමා |
| 29.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එස්.ඒ සිත්ති රෝසාන් මැතිතුමිය |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජේ. එම්. ඒ. අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා |

**සහභාගී වූ නිලධාරීන්**

| | | |
|---|---|---|
| 01. ලේකම් | - | ඩී.ජී.එම්.බී රණසිංහ මයා |
| 02. සංවර්ධන නිලධාරී | - | පී.ජී.අයි.එස් මනතුංග මිය |
| 03. සංවර්ධන නිලධාරී | - | එස්.බී පල්ලේකුඹුර මිය |

**(අ) පසුගිය මහා සභා වාර්තාව සහා සම්මත කිරීම**

2022 දෙසැම්බර් මස 13 වන දින පැවති සාමාන්‍ය මහා සභාවේ වාර්තාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාට ලැබී ඇති බැවින් එම වාර්තාවේ සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා විසින් පිටු අංක 6 හි 10 වන පේළියේ තම අදහස් දැක්වීම යටතේ " කැලිකසල ගැටලුවට විසඳුමක් ලෙස අපි එහිදී දැන් කොම්පෝස්ට් අංගනය තිබෙන ස්ථානයටයි එදා කසල බැහැර කිරීම ආරම්භ කළේ " යන්න " කැලිකසල ගැටලුවට විසඳුමක් ලෙස අපි එහිදී යාලුගහවෙල වටගොඩ සීමාවේ ඇති මෙම ඉඩමටයි කසල බැහැර කළේ." යනුවෙන් ද,එම ඡේදයේම 17 වන පේළියෙහි "එහිදී කඩිනම් පියවරක් ලෙස අප ඔවුන්ට පොරොන්දු වූ පරිදි එදිනම ගොස් වැසී තිබූ බෝක්කු නැවත පිළිසකර කළ අතර,සති 2-3 ක් ඇතුළත විසිරී තිබූ සියලුම කුණු එක්රැස් කර මුළු ගමම සුද්ධ පවිත්‍ර කර දුන්නා.එමෙන්ම කුඹුරුවලට සිදු වූ අලාභානි වලට වන්දි ලබා දී එම ජනතාවගේ ජන ජීවිතය යම් තරමකින් හෝ යථා තත්වයට පත් කළා" යන්න"එහිදී කඩිනම් පියවරක් ලෙස අප ඔවුන්ට පොරොන්දු වූ පරිදි එදිනම ගොස් වැසී තිබූ බෝක්කු නැවත පිළිසකර කළ අතර,සති 2-3 ක් ඇතුළත කුණු වලින් යටවී තිබූ කුඹුරු 2ක ම සුද්ධ පවිත්‍ර කර දී, සිදු වූ අලාභානි වලට වන්දි ලබා දී එම ජනතාවගේ විරෝධය තාවකාලිකව පාලනය කළා"යනුවෙන් ද,

එම ඡේදයේම 21 වන පේළියෙහි " එමෙන්ම අපි එම ඉඩමෙහි ෂීට් සෙවිලි කරන ලද විශාල ගොඩනැගිල්ලක් සාදා අඩි 20ක් පමණ යටට කුණු දැමීමට බේසම් සෑදූ අතර,එම භූමිය නිසි ලෙස කොන්ක්‍රීට් කර විධිමත් කාණු පද්ධතියක් ද සකස් කරනු ලැබුවා " යන්න " එමෙන්ම අපි එම ඉඩමෙහි ෂීට් සෙවිලි කරන ලද විශාල ගොඩනැගිල්ලක් සාදා තිබුණා.එහි අඩි 20ක් පමණ දිගට කුණු දැමීමට බේසම් හැඩති වළවල් සාදා කොන්ක්‍රීට් යොදා විධිමත් කළා" යනුවෙන් ද සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

ඉහත සංශෝධන වලට යටත්ව 2022 දෙසැම්බර් මස 13 වන දින පැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම් ශාන්ත සෙනවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.එම් සරුක් මැතිතුමා පෙ.ව 9.40 ට පමණ ගරු මහා සභාවේ අවසරය ලබාගෙන සභා ගර්භයෙන් පිටව යන ලදී.)

**(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

**(ආ.1** ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරිගේ අත්සනින් යුතු විගණන විමසුම් අංක KDB/F/PS-AK/2022/මු.වි/13 හා 2022.12.22 දිනැති විගණකාධිපති වාර්තාව ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ආ.2** මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් හා සහකාර තේරීම්භාර නිලධාරී විසින් එවන ලද KE/1/R/2022 හා 2022.12.28 දිනැති ලිපියට අනුව "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023-පළාත් පාලන ආයතන කොට්ඨාශ අනුව සැකසූ ඡන්දහිමි නාමලේඛනය ප්‍රදර්ශනයට තැබීම" යන හිසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ඇ) සභාවට ලැබී ඇති ලිපි, සංදේශ, පෙත්සම් ඉදිරිපත් කිරීම - කිසිවක් නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - කිසිවක් නැත**

## (ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා

### ඉ.1 ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා

**ඉ.1.1** සයිස්ටන් ජල යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගන්නා ජල පාරිභෝගිකයින් 64 දෙනා මෙතෙක් ගිවිසුම් ගත කර නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටළුකාරී තත්වයන් මතුව ඇත.එබැවින් එම ජල පාරිභෝගිකයින් ගිවිසුම් ගත කිරීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා,

සයිස්ටන් ජල යෝජනා ක්‍රමයේ මෙන්ම මාවතුපොල ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින්ද ගිවිසුම්ගතකර එම ජල යෝජනා ක්‍රමයද විධිමත් කරන ලෙස ඉල්ලා සිටිනවා.එමෙන්ම එහි කැඩී ඇති ජල මෝටරය ද කඩිනමින් අලුත්වැඩියා කිරීමට අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

එහි ජල මෝටරය මිලදී ගත් නියෝජිත ආයතනය මගින් අදාළ ජල මෝටරය අලුත්වැඩියා කර දෙන බවට පොරොන්දු වුවත්,මෙතෙක් එය අලුත්වැඩියා කර නොදුන් බැවින්, මේ වන විටත් අප ඒ සඳහා මනා දැනුමක් ඇති වෙනත් තාක්ෂණ ශිල්පියෙක් යොදවා තිබෙනවා. ඒ අනුව සතියක් වැනි කාලයක් ඇතුළත එය අලුත්වැඩියා කර ගැනීමේ හැකියාව ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.1 සයිස්ටන් ජල යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගන්නා ජල පාරිභෝගිකයින් 64 දෙනා මෙතෙක් ගිවිසුම් ගත කර නොමැති බැවින්,එම ජල පාරිභෝගිකයින් 64 දෙනා සභාව සමඟ ගිවිසුම්ගත කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.2** අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහා ඔයේ රොන්මඩ තුළින් වැලි වෙන් කර අලෙවි කිරීමේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියේ සංශෝධිත ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.අස්මීර් අලි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

කලින් ව්‍යාපෘති වාර්තාවක් අපි සභාගත කළා.එම වාර්තාවේ සහ මෙම සංශෝධිත ව්‍යාපෘති වාර්තාවේ වෙනස වන්නේ පිරිවැය ඇස්තමේන්තුවේ සහ ආදායම් ඇස්තමේන්තුවේ ඇති වෙනස පමණයි.එම සංශෝධන පහත පරිදි වන බව ප්‍රකාශ කර සිටින ලදී.

| සංශෝධිත කරුණ | පෙර ව්‍යාපෘති වාර්තාවේ සඳහන්ව ඇති මුදල (රු.) | සංශෝධිත ව්‍යාපෘති වාර්තාවේ සඳහන්ව ඇති මුදල (රු.) |
|---|---|---|
| පිරිවැය ඇස්තමේන්තුව | 14,937,850.00 | 6,585,306.40 |
| ආදායම් ඇස්තමේන්තුව | 1,700,000.00 | 960,000.00 |

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.2 අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහා ඔයේ රොන්මඩ තුළින් වැලි වෙන් කර අලෙවි කිරීමේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව වන රු.6,585,306.40 ක මුදල සහ ආදායම් ඇස්තමේන්තුව වන රු.960,000.00 ක මුදල දරන සංශෝධන ඇතුළත් සංශෝධිත ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.3** අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඇති බුලුගොහොතැන්න, මල්වානහින්න, ඇල්ලේකඩේ, තෙලඹුගහවත්ත හා කුරුගොඩ යන අතුරු මාර්ග වල ඇති ත්‍රිරෝද රථ නැවතුම්පොළවල් සඳහා ලියාපදිංචි ගාස්තුව ලෙස රු.10,000.00 ක මුදලක් අයකිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.එම්.හස්වර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

අතුරු මාර්ගවල ඇති ත්‍රිරෝද රථ නැවතුම්පොළවල්වලින් ද නගරබද ත්‍රිරෝද රථ නැවතුම්පොළවල්වලින් අයකරන ලියාපදිංචි ගාස්තුව වන රු.30,000.00 ක මුදලම අයකිරීම අසාධාරණ බැවින්,ඒ සඳහා යම් සාධාරණයක් ඉටු කරන ලෙසට ඔවුන් විසින් ඉල්ලීමක් සිදු කර තිබෙනවා.ඒ අනුව ඔවුන්ගෙන් රු.10,000ක මුදලක් පමණක් අය කිරීමට මුදල් කමිටුවේදී සාකච්ඡා කර තීරණයක් ලබාගත් බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.3 අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඇති බුලුගොහොතැන්න, මල්වානහින්න, ඇල්ලේකඩේ,තෙලඹුගහවත්ත හා කුරුගොඩ යන අතුරු මාර්ග වල ඇති ත්‍රිරෝද රථ නැවතුම්පොළවල් සඳහා ලියාපදිංචි ගාස්තුව ලෙස රු.10,000.00 ක මුදලක් අයකිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.නිරංජන් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා**

**ඉ.2.1** 2023 වර්ෂයේ පොදු අරමුදලෙන් සිදු කරන සංවර්ධන යෝජනා යටතේ බල ප්‍රදේශයේ වගා කටයුතු සිදු කරන ගොවියන් මුහුණපාන වන සතුන්ගෙන් වන හානිය අවම කිරීම සඳහා වායු රයිෆල් ලබා දීම වෙනුවෙන් රු.300,000.00 ක මුදලක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව යෙදවීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

මීට අදාලව පහත සඳහන් නම් ලැයිස්තුව ද ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ලබා දී ඇති බැවින්,එහි ඉදිරි කටයුතු ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සිදු කල යුතු බව පෙන්වා දෙන ලදී.

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 01. | ඩබ්.ජී ජයසේන මයා | 413/1,දිප්පිටිය,අලවතුගොඩ |
| 02. | බී.ජී.වී ගුණතිලක මයා | 378/2,දිප්පිටිය ජනපදය, අලවතුගොඩ |
| 03. | ජී.එන්.ජී මුතුබණ්ඩා මයා | 391, දිප්පිටිය,අලවතුගොඩ |
| 04. | එල්.ඩබ්.ජී සුනිල් මයා | 510/5, දිප්පිටිය ජනපදය,අලවතුගොඩ |
| 05. | පී.ජී.පී.එස් සුබසිංහ මයා | 504, දිප්පිටිය,අලවතුගොඩ |
| 06. | කේ.එම් වසන්ත කුමාර මයා | ගමගෙදර,දිප්පිටිය,අලවතුගොඩ |
| 07. | ඩී.ජී දයානන්ද මයා | 390/1,දිප්පිටිය,අලවතුගොඩ |
| 08. | ඩබ්.ජී නිලංක උපුල්දෙණිය මයා | 381/1,දිප්පිටිය,අලවතුගොඩ |
| 09. | ජී.ජී නිමල් කරුණාරත්න මයා | නිල්මිණි නිවස,දිප්පිටිය,අලවතුගොඩ |
| 10. | එච්.ජී සුසන්ත කුමාරලාල් මයා | 539/1, දිප්පිටිය ජනපදය,අලවතුගොඩ |

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.1 2023 වර්ෂයේ පොදු අරමුදලෙන් සිදු කරන සංවර්ධන යෝජනා යටතේ බල ප්‍රදේශයේ වගා කටයුතු සිදු කරන ගොවියන් මුහුණපාන වන සතුන්ගෙන් වන හානිය අවම කිරීම සඳහා ගොවිජන සේවා නිලධාරීන්ගේ නිර්දේශ අනුව තෝරාගත් ගොවීන් සඳහා වායු රයිෆල් ලබා දීම වෙනුවෙන් රු.300,000.00 ක මුදලක් විෂය භාර ගරු අමාත්‍යතුමා ලෙස මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව යෙදවීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3 ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා (2022.12.02, 2022.12.16 සහ 2022.12.23 දිනවල පැවති මුදල් කමිටු නිර්දේශ )**

**ඉ.3.1** අංක: 216/ඊ ,කුරුගොඩ හන්දිය ,මාතලේ පාර,අකුරණ යන ලිපිනයේ පිහිටි ඒ.එම්.එම් පාරිස් යන අය විසින් පවත්වාගෙන යනු ලබන ගව මස් කඩයට අදාළ බලපත්‍රය අංක 426/ඒ,වරාගස්හින්න ලිපිනයේ පදිංචි මොහොමඩ් හස්මි මොහොමඩ් අම්හාර් යන අයගේ නමට පවරා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.1 අංක: 216/ඊ ,කුරුගොඩ හන්දිය ,මාතලේ පාර,අකුරණ යන ලිපිනයේ පිහිටි ඒ.එම්.එම් පාරිස් යන අය විසින් පවත්වාගෙන යනු ලබන ගව මස් කඩයට අදාළ බලපත්‍රය අංක 426/ඒ,වරාගස්හින්න ලිපිනයේ පදිංචි මොහොමඩ් හස්මි මොහොමඩ් අම්හාර් යන අයගේ නමට පවරා දීම සඳහා ගෝඝාතක ආඥා පනත යටතේ ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.2** අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු සංවර්ධන ක්‍රියාවලියේදී හා පොදු ස්ථාන අවහිර වන ලෙසින් ඇති ගස් කපා විකිණීමට අදාළව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර ඇති පහත සඳහන් තක්සේරු වාර්තාවට අනුව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු සංවර්ධන ක්‍රියාවලියේදී හා පොදු ස්ථාන අවහිර වන ලෙසින් ඇති ගස් කපා විකිණීමට අදාළ කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

| අනු අංකය | ගස් අංකය | ගස් වර්ගය | ගස් කපා විකිණීමට අදාළ තක්සේරු මුදල (රු) |
|---|---|---|---|
| 01 | 1 | කොස් | 19000.00 |
| 02 | 2 | කුඩු දවුලා | 2000.00 |
| 03 | 3 | කොස් | 4500.00 |
| 04 | 4 | මහෝගනී | 200000.00 |
| 05 | 5 | ඇල්බීසියා | 5500.00 |
| 06 | 5 | ඇල්බීසියා | 2700.00 |
| 07 | 5 | ඇල්බීසියා | 4800.00 |
| 08 | 5 | ඇල්බීසියා | 1200.00 |
| 09 | 5 | ඇල්බීසියා | 1200.00 |
| 10 | 5 | ඇල්බීසියා | 1700.00 |
| 11 | 5 | ඇල්බීසියා | 3200.00 |
| 12 | 5 | ඇල්බීසියා | 1000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

මහෝගනී ගසක් රු.ලක්ෂ 2 කට තක්සේරු කර තිබෙනවා.ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති තක්සේරු මුදලට අපට එම ගස් විකිණිය හැකිද යන ගැටලුව මෙහිදී මතුවෙනවා. නමුත් අපට එම ක්‍රමවේදයට පරිබාහිරව කටයුතු කිරීමේ හැකියාවක් ද නොමැති බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා,

මෙහි සඳහන් කර ඇත්තේ හදිරම හන්දියේ සුසාන භූමියේ ඇති මහෝගනී ගස පිළිබඳව විය යුතුයි.මමත් එම ගස සම්බන්ධයෙන් කිහිපදෙනෙක් සමඟම කතා කළා.එහිදී ඔවුන් කියා සිටියේ එහි උපරිම වටිනාකම රු.60,000 - 70,000 ක් පමණ වන අතර,එම ගස කපා දැමීමට අවම වශයෙන් රු.30,000 ක මුදලක් වත් අවශ්‍ය වන බවයි.මෙම ගසේ අතු කඩා වැටීම හේතුවෙන් මේ වන විටත් අසල ඇති ගොඩනැගිල්ලේ ෂීට් ලෑලි කිහිපයක්ම කැඩී ගොස් තිබෙනවා.එබැවින් අවම වශයෙන් මෙහි අතු ටික කපා ගස බිම හෙලීමේ යම් ක්‍රමවේදයක් සකසන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

මෙහිදී අපට ගස වෙන්දේසි කිරීමට සිදුවන බැවින් වෙන්දේසි කර බලමු. එසේ නොවුණහොත් ගරු අමරජීව මන්ත්‍රීතුමා පැවසූ පරිදි ගහ බිම හෙලීමට තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.2 අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු සංවර්ධන ක්‍රියාවලියේදී හා පොදු ස්ථාන අවහිර වන ලෙසින් ඇති ගස් කපා විකිණීමට අදාළව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තක්සේරු වාර්තාවට අනුව එම මුදල අවම ලංසු ලෙස තබාගනිමින් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.3** අකුරණ බලප්‍රදේශය තුළ අකුරණ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ හඳුනාගැනීමේ පහසුව සඳහා සුදුසු ස්ටිකරයක් සකස් කිරීම සුදුසු බවත්,එසේ සකස් කරන ලද ස්ටිකර් අකුරණ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ත්‍රි රෝද රථ වලට ලබා දීමටත්,ඒ සඳහා වැයවන මුදල එම ලියාපදිංචි ත්‍රිරෝද රථ හිමියන්ගෙන් අයකරගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.අයි.මොහමඩ් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

අප මහජන නියෝජිතයන් ලෙසින් අදාළ ස්ටිකරය සහිත ත්‍රිරෝදරථ පමණක් තම අවශ්‍යතාවයන් සඳහා යොදා ගන්නා ලෙසට ජනතාව දැනුවත් කල යුතු වෙනවා.පසුගිය මාස 3 ක් තිස්සේ අප විසින් සිදුකළ වැටලීම් වලින් හඳුනාගත් දෙයක් වන්නේ සභාවේ ලියාපදිංචි වී ඇති ත්‍රිරෝදවලට සමානව අනවසර ත්‍රිරෝද රථ ප්‍රමාණයක් ද

තිබෙන බවයි.ඔවුන් ද ප්‍රසිද්ධ ස්ථානවල ත්‍රිරෝද රථ ගාල් කර යම් ආදායමක් ලබා ගන්නවා.එබැවින් මේ සම්බන්ධයෙන් අප ජනතාව දැනුවත් කර සභාවේ ලියාපදිංචි වී තිබෙන ත්‍රිරෝද රථ සඳහා යම් සාධාරණයක් ඉටු කිරීමට ඔවුන්ට අපගේ සහය ලබා දිය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. නිරංජන් කරුණාරත්න මැතිතුමා,

අපි වාර්ෂිකව යම් ගාස්තුවක් ඔවුන්ගෙන් අය කරන බැවින්,මෙම ස්ටිකරය ගාස්තු අය කිරීමකින් තොරව ලබා දුන්නොත් ඔවුන් එම ස්ටිකරය ලබාගැනීමට මීට වඩා උනන්දුවක් දක්වනු ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

සභාව මෙමගින් ලබාගන්නේ ද ඉතා සුළු මුදලක්.ස්ටිකර් එකක් මුද්‍රණය කිරීමට පමණක් අපට සාමාන්‍යයෙන් රු.150.00 කට වඩා මුදලක් වැය වෙනවා.මෙය මහජන සුභසාධන කාර්යයක් නම් එය නොමිලේ ලබාදෙන්න තිබුනා.එබැවින් අප මින් ලාභයක් බලාපොරොත්තු නොවී ස්ටිකරය මුද්‍රණය සඳහා වැය වන මුදල පමණක් ඔවුන්ගෙන් අය කර ගැනීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා,

ස්ටිකරයක් සඳහා රු.100 ක් අය කිරීම එතරම් ගැටළුවක් නොවෙයි.එහි ඊට වඩා වටිනාකමක් තිබෙනවා.එමෙන්ම ස්ටිකරය ලබාදෙන විට අදාළ ත්‍රිරෝද රථය සභාවට ගෙන්වා අපගේ නිලධාරියෙක් ලවාම සෑම ත්‍රිරෝද රථයකම එකම ස්ථානයක එය ඇලවීමට යම් ක්‍රමවේදයක් සකස් කරන්නේ නම් වඩාත් සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා,

මේ වන විට සභාවේ ලියාපදිංචිමට අපේක්ෂාවෙන් බොහෝ ත්‍රිරෝද රථ හිමියන් ප්‍රමානයක් සිටිනවා.ඔවුන් ලියාපදිංචි වීම සඳහා අපගෙන් තව මාසයක පමණ කාලයක් ලබාදෙන ලෙසට ඉල්ලීම් සිදු කරන බැවින් ඔවුන්ට ඒ සඳහා යම් කාලයක් ලබාදීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

අලුතෙන් ස්ටිකර් ලබා දෙන බව දැනගත් විට අලුත් සාමාජිකයන් එනවා ලියාපදිංචි වෙන්න .ඔවුන්ට අපට ප්‍රමුඛතාවයක් ලබා දෙන්න බැහැ.දැනට ධාවනයේ යෙදෙන ත්‍රිරෝද රථ සඳහායි අප ප්‍රමුඛතාවය ලබා දිය යුතු වන්නේ.එබැවින් ඔවුන්ගේ ඉල්ලීම සලකා බලා යම්කිසි කාලයක් ලබා දීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා,

මේ වන විට අනවසරයෙන් ත්‍රිරෝද රථ ධාවනයේ යොදවන්නන් ඉල්ලා සිටින්නේ ඔවුන්ට එක්වරම රු.30,000 ක මුදලක් ගෙවීම අපහසු බැවින්, එම මුදල ගෙවීම සඳහා මාස 4-5 පමණ කාලයක් ලබා දෙන ලෙසයි.එම සහන කාලය ලබා දිය හැකි නම් අපට අනවසරයෙන් ධාවනය වන ත්‍රිරෝද රථ සභාවේ ලියාපදිංචි කරවා, සභාවට යම් ආදායමක් සලසා දිය හැකි බව ප්‍රකාශ කර සිටින ලදී .

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා,

ඔවුන් රු.30,000 ක මුදල ගෙවීම අපහසු බව පැවසුවත්,මෙම ත්‍රිරෝද රථ නැවතුම්පොළවල ඇති අති බහුතරයක් ත්‍රිරෝද රථවල ධාවන පර්මිට් එක ලබා ගෙන තිබෙන්නේ රු.ලක්ෂ 2- 3 ක් වැනි මුදලක් වියදම් කරලා.අප එම තත්වය පාලනය කිරීමටයි මීට අදාළ අතුරු ව්‍යවස්ථාවක් සකස් කර, ඊට අදාළ නීති රීති පනවාගෙන, සභාව මැදිහත්වී එම නීති රීති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට තීරණය කරනු ලැබුවේ.එබැවින් මේ අවස්ථාවේ රු.30,000 ක මුදල සංශෝධනය කිරීම සුදුසු වන්නේ නැහැ.සභාවට ලැබෙන ආදායම් අඩු කළහොත් සභාවේ වැඩකටයුතු සිදු කිරීමේදී ගැටළුවක් මතු විය හැකියි.එමෙන්ම ත්‍රීරෝදරථ ලියාපදිංචියේදී නිසි පරිදි සොයා බලා කොට්ඨාසය තුළ සිටින සුදුසුකම් ලත් පිරිසක් පමණක් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී .

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම් ශාන්ත සෙනවිරත්න මැතිතුමා,

ත්‍රිරෝද රථ සංගමය මෙන්ම අලවතුගොඩ නගරය තුළ ලොරි රථ සංගමයක් සහ වෑන් රථ සංගමයක් ද තිබෙනවා.එබැවින් ඒ පිළිබඳව සොයා බලා ඔවුන්ට ද යම් සාධාරණයක් ඉටු කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,

වැටලීම් සිදු කිරීමේදී අපට දක්නට ලැබුණේ ඇතැම් ත්‍රිරෝද රථ නැවතුම්පොලවල් වෙනම නීති රීති වලට අනුව ක්‍රියාත්මක වන බවයි.එවැනි පුද්ගලයන්ට සභාව සතු බලතලයන් මොනවාද යන්න පෙන්වා දීමට ද අප විවිධ වැඩපිළිවෙලවල් සිදු කර තිබෙනවා.රථ වාහන සම්බන්ධයෙන් වන නීති රීති විශාල ප්‍රමාණයක් තිබෙනවා.අප එම නීතිවලට අනුගත වියයුතු අතර,ඒ සම්බන්ධයෙන් මහජනතාව ද දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.3 අකුරණ බලප්‍රදේශය තුළ අකුරණ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ත්‍රී රෝද රථ හඳුනාගැනීමේ පහසුව සඳහා ස්ටිකරයක් සකස් කිරීම සුදුසු බවත්,එසේ සකස් කරන ලද ස්ටිකර් අකුරණ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ත්‍රී රෝද රථ වලට ලබා දීමටත්,ඒ සඳහා වැයවන මුදල එම ලියාපදිංචි ත්‍රීරෝද රථ හිමියන්ගෙන් අයකරගැනීමත් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.4** 2023 වර්ෂයේ පොදු අරමුදලින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා වෙත වෙන්වූ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් හා පාසල් උපකරණ ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රු.300,000.00 ක මුදලක් වෙන්කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිරිමල් විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.4 2023 වර්ෂයේ පොදු අරමුදලින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා වෙත වෙන්වූ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් හා පාසල් උපකරණ ලබා ගැනීම සඳහා විෂය භාර ගරු අමාත්‍යතුමා ලෙස මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රු.300,000.00 ක මුදලක් වෙන්කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.5** අකුරණ දුනුවිල පාරේ "B"ත්‍රීරෝද රථ නැවතුම්පොළට අදාලව අකුරණ ප්‍රාදේශීය සභාවේ ත්‍රීරෝද රථයක් ලියාපදිංචි කිරීමට අදාළ ගාස්තු නොගෙවා ධාවනය කරනු ලබන පහත සඳහන් ත්‍රීරෝද රථ 20 හි හිමිකරුවන් අකුරණ ප්‍රාදේශීය සභාවේ නීත්‍යානුකූලව ගාස්තු ලබාගෙන ලියාපදිංචි කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

| අනු අංකය | නම | ත්‍රීරෝද රථ අංකය |
|---|---|---|
| 01 | එන්.එම්.නුස්රි | CPGZ-7144 |
| **02** | එම්.අලි රිස්ලාන් | CPQX-4698 |
| 03. | එන්.එම්.රිෆ්ලාන් | CPYX-4241 |
| 04. | එස්.එම් .ඉලියාස් | CPAAK-5439 |
| 05. | එම්.උමායිර් | CPYQ-2549 |
| 06. | එස්.එම් කලීල් | CPQX-7133 |
| 07. | ඒ.එම් හිලභි | CPAAF-2628 |
| 08. | එස්.එම් සිරාජ් | CPYZ-3371 |
| 09. | එම්.එන්.නසීර් | CPYX-4938 |
| 10. | එම්.එම් සාධික් | CPYK-4664 |
| 11. | එම්.හිලගෙයි | CPQQ-4894 |
| 12. | එන්.එම් අහමඩ් | CPAAI-3342 |
| 13. | එෆ්.ඉලියාස් | CPYA-2445 |
| 14. | එම්.හෆීල් | CPQS-0179 |
| 15. | එම්.රිෆාස් | NCYY-4808 |
| 16. | එස්.එම් සාකිර් | CPCW-8461 |
| 17. | එම්.නාබික් | CPQP-8051 |

| | | |
|---|---|---|
| 18. | **එම්.මහීර්** | **CPAAM-0499** |
| 19. | **අයි.ආරියාවල** | **CPQO-4348** |
| 20. | **එම්.ආදිල්** | **CPQO-1322** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.ගාමිණී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය

**ඉ.3.5 අකුරණ දුනුවිල පාරේ "B"ත්‍රීරෝද රථ නැවතුම්පොළට අදාලව අකුරණ ප්‍රාදේශීය සභාවේ ත්‍රීරෝද රථයක් ලියාපදිංචි කිරීමකින් තොරව ධාවනය කරනු ලබන ඉහත සඳහන් ත්‍රීරෝද රථ 20 අකුරණ ප්‍රාදේශීය සභාවේ නීත්‍යානුකූලව ගාස්තු ලබාගෙන ලියාපදිංචි කර ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.6** යාලුගහවෙල කසල අංගනයේ වහලය සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවීමට අදාලව පළාත් පාලන ඉංජිනේරුගේ කමිටු සභාපතිතත්වයෙන් පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ පැවති තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුව වැට් රහිත රු.8285916.00ක මුදලකට අවම මිල ගණන් ඉදිරිපත් කළ අංක 92,බෝගස් හන්දිය,අරලගන්විල පිහිටි ඔරෙල්කෝ කන්ස්ට්‍රක්ෂන් වෙතින් අදාළ කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තාක්ෂණ ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලදී.ඒ අනුව මෙම කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමට ප්‍රථම අදාළ සමාගම විසින් කාර්යය සාධන ඇපකරය 10%කින් වැඩි කර ලබා ගැනීමේ කොන්දේසියට යටත්ව ඔරෙල්කෝ කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත අදාළ කොන්ත්‍රාත්තුව ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.

එම යෝජනාව ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.6 යාලුගහවෙල කසල අංගනයේ වහලය සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවීමට අදාලව පළාත් පාලන ඉංජිනේරුගේ කමිටු සභාපතිතත්වයෙන් පැවති තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුව වැට් රහිත රු.8285916.00ක මුදලකට අවම මිල ගණන් ඉදිරිපත් කළ අංක 92,බෝගස් හන්දිය,අරලගන්විල පිහිටි ඔරෙල්කෝ කන්ස්ට්‍රක්ෂන් වෙතින් අදාළ කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තාක්ෂණ ඇගයීම් කමිටු විසින් ලබාදුන් නිර්දේශ අනුව මෙම කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමට ප්‍රථම අදාළ සමාගම විසින් කාර්යය සාධන ඇපකරය 10% දක්වා වැඩි කර ලබා ගැනීමේ කොන්දේසියට යටත්ව ඔරෙල්කෝ කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමාගේ යෝජනා (2022.12.22 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු නිර්දේශ )**

**ඉ.4.1** 2022.12.22 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 01–i-(අ ) නිර්දේශය වන 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ආයුර්වේද සේවා ගාස්තු වශයෙන් අයකරනු ලබන රු.10.00 ක මුදල සේවා ලාභීන්ගෙන් අය නොකිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.අස්මීර් අලි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා,

අප ආයුර්වේද වෛද්‍ය සේවාව ලබාදෙන්නේ මහජන සුභ සාධක කටයුත්තක් ලෙසින් වුවත්,එහිදී ගාස්තුවක් ලෙස රු.10.00 ක මුදලක් අය කිරීම සම්බන්ධයෙන් යම් යම් ගැටළු මතුව තිබෙනවා.බොහෝ පුද්ගලයින් සිතා සිටින්නේ බෙහෙත් ලබා දෙනු ලබන්නේ රු.10.00ක මුදලට අදාළව පමණක් බවයි.එබැවින් 2023 වර්ෂයේ සිට රෝගීන්ගෙන් එම ගාස්තුව අය නොකිරීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී .

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.4.1 2022.12.22 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 01–i-(අ ) නිර්දේශය වන 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ආයුර්වේද සේවා ගාස්තු වශයෙන් අයකරනු ලබන රු.10.00 ක මුදල සේවා ලාභීන්ගෙන් අය නොකිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.4.2** 2022.12.22 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 03–i-(ආ ) නිර්දේශය වන දිප්පිටිය පෙර පාසලට කිසිදු දෛනික දීමනාවකින් තොරව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සහයිකාවක් බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා,
දිප්පිටිය ප්‍රදේශයේ පදිංචි සිසුවියක් විසින්ම අපගෙන් ඉල්ලීම් කර තිබෙනවා කිසිදු ගෙවීමකින් තොරව තම කැමැත්තෙන්ම ගමට කරන සේවයක් ලෙසින් පෙර පාසලේ ඉගැන්වීම් කටයුතු වලට සහය වීමට අවස්ථාව ලබා දෙන ලෙසට.ඒ අනුව මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.4.2 2022.12.22 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ අංක 03–i-(ආ ) නිර්දේශය වන දිප්පිටිය පෙර පාසලට දීමනාවකින් තොරව ස්වේච්ඡාවෙන් ඉගැන්වීම සඳහා පෙරපාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාවක් සහිත NVQ-4 මට්ටමේ ප්‍රවීණතාවය ලබා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති 604,දිප්පිටිය,අලවතුගොඩ යන ලිපිනයේ පදිංචි ආර්.එම් සෞම්‍යා ගීතාංගනී රත්නායක මෙය පෙර පාසල් සහයිකාවක් ලෙස බඳවා ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමාගේ යෝජනා (2022.12.22 දින පැවති කර්මාන්ත කමිටු නිර්දේශ )**

**ඉ.5** 2022.12.22 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 14 -33 දක්වා වන නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීම |
|---|---|
| 01. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිහිමතුනිසා මැතිතුමිය විසින් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී කොට්ටාශ මට්ටමින් වැසිකිලි ඉදි කිරීම (දුනුවිල)-රු 50000.00 -ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව වැලිකැටිය ගොවි සංවිධානයට ලබාදීම |
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්. මුෆීද් මැතිතුමා විසින් රාහුමානියා අරාබි පාසල අසලින් යන පාර සංවර්ධනය කිරීම ii අදියර-රු100000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව කොනකලගල උදාර ගොවි සංවිධානයට ලබාදීම |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම.ඒ.යූ රහ්මාන් මැතිතුමා විසින් උග්ගල ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම -රු180000 .00 -ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව කොනකලගල උදාර ගොවි සංවිධානයට ලබාදීම |

| | |
|---|---|
| 04. | දීගල පෙරපාසල් මාර්ගය සංවර්ධනය කිරීම -රු 655500.00 - ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව කොනකලගල උදාර ගොවි සංවිධානයට ලබාදීම |
| 05. | ඇල්ලේකඩේ පුස්තකාලයේ පවතින අඩුපාඩු පිළිසකර කර ගැනීම රු 43000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව විලාන පල්ලේගම විමුක්ති ගොවි සංවිධානයට ලබාදීම |
| 06. | මාවතුපොල ප්‍රධාන මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරීම - රු.400000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව මාවතුපොල සිතමු කාන්තා ගොවි සංවිධානයට ලබාදීම |
| 07. | දීගල පෙරපාසල් ගොඩනැගිල්ලේ තීන්ත අලේප කිරීම - රු.332000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව උදාර ගොවි සංවිධානයට ලබාදීම |
| 08. | වැලි කැනීමේ යන්ත්‍රය ස්ථාපිත කර ඇති ස්ථානයේ මාර්ගය සංවර්ධනය කිරීම රු.1885000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව උදාර ගොවි සංවිධානයට ලබාදීම |
| 09. | කොනකලගල සමාධි මාවත මාර්ගය සංවර්ධනය කිරීම .රු.750000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව උදාර ගොවි සංවිධානයට ලබාදීම |
| 10. | අලවතුගොඩ මහජන පුස්තකාලයේ අබලන්ව ඇති ස්ථාන පිළිසකර කර ගැනීම -රු 25000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව දෙල්ගස්ගොඩ ගොවි සංවිධානයට ලබාදීම |
| 11. | මේල්වේන මාර්ගයේ (B කොටස) සංවර්ධනය කිරීම රු 262000 .00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව බුලුගොහොතැන්න ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම |
| 12. | පල්ලේවැලිකැටිය දෙල්ගහගොඩ පාර සංවර්ධනය කිරීම රු.150,000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව වැලිකැටිය ගොවි සංවිධානයට ලබාදීම |
| 13. | ගරු සභාපතිතුමා අයි.එම ඉස්තිහාර් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් මිහුරාර් මැතිතුමා විසින් බුලුගොහොතැන්න මේල්වේන මාර්ගය සංවර්ධනය කිරීම - රු 250000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව බුලුගොහොතැන්න ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම |
| 14. | සයිලන්වත්ත පොදු සුසාන භූමියේ මායිම් කණු සෑදීම - රු 386700 .00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව දෙල්ගස්ගොඩ ගොවි සංවිධානයට ලබාදීම |
| 15. | යාලුගහවෙල කසල අංගනයේ කානු පද්ධතිය සංවර්ධනය කිරීම - රු520000 .00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව දෙල්ගස්ගොඩ ගොවි සංවිධානයට ලබාදීම |
| 16. | ඇල්ලේකඩේ පුස්තකාලය සංවර්ධනය කිරීම -රු 500000 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව විලාන පල්ලේගම විමුක්ති ගොවි සංවිධානයට ලබාදීම |
| 17. | කුරුගොඩ රෝහල් මාර්ගය (පිටියකඩේ පාර) සංවර්ධනය කිරීම -රු 500000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව හුරිගොල්ල i ගොවි සංවිධානයට ලබාදීම |
| 18. | දොඩන්ගොල්ල අතුරු මාර්ගය මාර්ගය සංවර්ධනය කිරීම -රු 250000 .00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව බුලුගොහොතැන්න ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම |
| 19. | ගරු උපසභාපති ඒ.එස්.එම්.අමරකෝන් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.එස් සෙනෙවිරත්න මැතිතුමා විසින් කපුලන්ද පාර මැද කොටස සංවර්ධනය කිරීම-රු.100000.00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව දෙල්ගස්ගොඩ ගොවි සංවිධානයට ලබාදීම. |
| 20. | මේල්වේන මාර්ගය (C කොටස )සංවර්ධනය කිරීම - රු.1013000 .00 ඇස්තමේන්තුව නිර්දේශ කිරීම හා එම කොන්ත්‍රාත්තුව බුලුගොහොතැන්න ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම |

එම යෝජනාව ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.5 2022.12.22 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 14 -33 දක්වා වන ඉහත සංවර්ධන ව්‍යාපෘතීන් ඉටු කිරීමට අදාළ නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**<u>ප්‍රාදේශීය සභා රීති මාලාවේ 11 (8) රීතිය අනුව කල් දී නොමැති යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා</u>**

**ඉ.6** 2022.08.04 දින සිට සේවයේ යොදවා ගන්නා ලද මාර්ග කම්කරුවන් දෙදෙනා වන ඒ.එම්.එන්.බී අබේසිංහ මයා සහ එම්.ඉෂාර මදුශංක සල්ගාදු මයා යන අයගේ සහ සෞඛ්‍යය කම්කරුවන් 6 දෙනා වන ඩී.එම්.ඩබ්.කේ දසනායක මයා, කේ.සිවගාමි මිය, කේ.ජී ධර්මදාස මයා, එන්.ජී.ඒ.ටී.කේ නුවරපක්ෂ මයා ,එන්.ජී සුනිල් මයා සහ බී.ජී සදීප ලක්ෂාන් මයා යන අයගේ සේවය 2023-02-04 දිනට මාස 03ක කාලය සම්පූර්ණ වන බැවින්, තව දුරටත් සේවා අවශ්‍යතාවය සලකා 2023-02-04 දින සිට 2023-05-04 දින දක්වා ඉදිරියට මාස 03 ක කාලයක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.6 2022.08.04 දින සිට සේවයේ යොදවා ගන්නා ලද මාර්ග කම්කරුවන් දෙදෙනා වන ඒ.එම්.එන්.බී අබේසිංහ මයා සහ එම්.ඉෂාර මදුශංක සල්ගාදු මයා යන අයගේ සහ සෞඛ්‍යය කම්කරුවන් 6 දෙනා වන ඩී.එම්.ඩබ්.කේ දසනායක මයා, කේ.සිවගාමි මිය, කේ.ජී ධර්මදාස මයා, එන්.ජී.ඒ.ටී.කේ නුවරපක්ෂ මයා ,එන්.ජී සුනිල් මයා සහ බී.ජී සදීප ලක්ෂාන් මයා යන අයගේ සේවය 2023-02-04 දිනට මාස 03ක කාලය සම්පූර්ණ වන බැවින්,සේවා අවශ්‍යතාවය සලකා 2023-02-04 දින සිට 2023-05-04 දින දක්වා ඉදිරියට මාස 03 ක කාලයක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත සේවයේ යොදවා ගැනීමත්,ඒ සඳහා වියදම් දැරීමත් සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.7** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 135(ඉ) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් බදුකරුවා 2023 වර්ෂය සඳහා පමණක් දරිද්‍රතාවය මත වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බව යෝජනා කරමි.

| **අනු අංකය** | **නම සහ ලිපිනය** | **වරිපනම් අංකය** | **වරිපනම් මුදල** |
|---|---|---|---|
| 1. | ඒ.ඩබ් අසීසා උම්මා මිය<br>416/6,<br>මාතලේ පාර,<br>අලවතුගොඩ. | 1002M2R1328/06 | රු.944.40 |

එම යෝජනාව ගරු උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.7 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 135 (ඉ) වගන්තිය ප්‍රකාරව වරිපනම් අංක 1002M2R1328/06 දරණ ඒ.ඩබ් අසීසා උම්මා මියගෙන් රු.944.40 ක මුදලක් 2023 වර්ෂය සඳහා පමණක් දරිද්‍රතාවය මත වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.8** අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම හා තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සඳහා සේවකයන් 12 දෙනෙකු තාවකාලිකව බඳවා ගැනීම සඳහා අනුමැතිය හිමිවී ඇති අතර,එම ලිපියේ පළමු කොන්දේසිය අනුව තවදුරටත් ඉහත කාර්යය ඉටු කරගැනීම සඳහා එම සේවකයින් සේවයේ යෙදවීම අවශ්‍ය වන බැවින්,2022-12-20 වන දින සිට 2022-03-20 වන දින දක්වා මාස 03ක කාලයක් ඔවුන් නැවත පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.8 අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම හා තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සඳහා සේවකයන් 12 දෙනෙකු තාවකාලිකව බඳවා ගැනීම සඳහා අනුමැතිය හිමිවී ඇති බැවින්ද,එම ලිපියේ පළමු කොන්දේසිය අනුව තවදුරටත් ඉහත කාර්යය ඉටු කරගැනීම සඳහා එම සේවකයින් සේවයේ යෙදවීම අවශ්‍ය වන බැවින් ද,2022-12-20 වන දින සිට 2022-03-20 වන දින දක්වා මාස 03ක කාලයක් ඔවුන් නැවත පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.9** 2023 වර්ෂයේ පොදු අරමුදලින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට යෝජිත පහත සඳහන් සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ප්‍රතිපාදන ඉල්ලුම් කරන මන්ත්‍රීතුමා /මන්ත්‍රීතුමිය | සංවර්ධන යෝජනා | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 01 | ගරු සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමා | 1.හුරීගොල්ල මාරහෙල මාර්ගය සංවර්ධනය කිරීම<br>2.කසාවත්ත අල් අක්ෂා මාර්ගය සංවර්ධනය කිරීම<br>3.බලකඩුව මාර්ගය සංවර්ධනය කිරීම<br>4.අඹකොටුව මාර්ගය සංවර්ධනය කිරීම<br>5.දුනුවිල වැව අසලින් ආරම්භ වන බටුවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම<br>6.දිප්පිටිය ජනපද මාර්ගය සංවර්ධනය කිරීම<br>7.බෝසංස මාර්ගය සංවර්ධනය කිරීම | 200,000.00<br>850,000.00<br>500,000.00<br>250,000.00<br>350,000.00<br>400,000.00<br>650,000.00 |
| 02 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.නිලාම් මැතිතුමා | විලන්දෙනිය තාප්ප පාර සංවර්ධනය කිරීම | 200,000.00 |
| 03 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.ජී.දමයන්ති මැතිතුමිය | සයිස්ටන් "ඒ" ජනපද මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 |
| 04 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිමල් විජේතුංග මැතිතුමා | ප්‍රාදේශීය සභාවට අයත් බෝමළු ඉඩමට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 |
| 05 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එම්. මුහීද් මැතිතුමා | වරාගස්හින්න දෙමටගස්තැන්න මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 |
| 06 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒයූ.රහ්මාන්මැතිතුමා | 1.උග්ගල ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම<br>2.කුරුඳුගහ ඇල පාසල මාර්ගය සංවර්ධනය කිරීම | 100,000.00<br>200,000.00 |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | 1.සමන් දේවාල පාරේ සිට හදිරම පාර දක්වා ඇති සමන් | 150,000.00 |

| | | | |
|---|---|---|---|
| | එච්.එම්.එස් සෙනවිරත්න මැතිතුමා | දේවාල පාර කොන්ක්‍රීට් කිරීම<br>2.දෙල්ගස්ගොඩ හපුඅංග පාරේ සිට නාගහපිටියට යන ගල්බොක්ක කුඹුර පාරට බෝක්කු 02ක් දැමීම | 150,000.00 |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් සරුක් මැතිතුමා | පොල්වත්ත පාර සංවර්ධනය කිරීම | 300,000.00 |
| 09 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.මිහුරාර් මැතිතුමා | 1. බෝසංස මාර්ගය සංවර්ධනය කිරීම<br>2.කටුකොල මාර්ගය සංවර්ධනය කිරීම<br>3.මාවින්න මාර්ගය සංවර්ධනය කිරීම | 100,000.00<br>100,000.00<br>100,000.00 |
| 10 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එෆ් අජ්මීර් මැතිතුමා | 1.දෙල්ගස්තැන්න මාර්ගය සංවර්ධනය කිරීම<br>2.දීගල මාර්ගය සංවර්ධනය කිරීම<br>3.කුරුගොඩ රෝහල් මාර්ගය සංවර්ධනය කිරීම | 100,000.00<br>100,000.00<br>100,000.00 |
| 11 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉස්වී මොහමඩ් මැතිතුමා | නීරැල්ල ගල්දෙමට මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 |
| 12 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි බී.කේ සීලවතී මැණිකේ මැතිතුමිය | හාලිඇල්ල කුඹුරුවලතැන්න මාර්ගයේ අශෝක අබේරත්න මහතාගේ ඉඩම අසල පාර මඩවන ස්ථානයට බෝක්කුවක් දැමීම | 300,000.00 |
| 13 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම් සව්රාජ් මැතිතුමා | තෙලඹුගහවත්ත පාර සිට ඒ-9 මාර්ගයට යන අඩිපාර සංවර්ධනය කිරීම | 300,000.00 |
| 14 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සිත්ති රෝසාන් මැතිතුමිය | තෙලඹුගහවත්ත සුසානභූමි මාර්ගයේ ආරක්ෂිත බැම්ම ඉදිකිරීම | 300,000.00 |
| 15 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඒ.ජී.ස්වර්ණලතා මැතිතුමිය | මානාගල විහාර මාවත සංවර්ධනය කිරීම | 200,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.9 2023 වර්ෂයේදී ඉහත සංවර්ධන ව්‍යාපෘති සඳහා පොදු අරමුදලින් මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමේ හැකියාව සලකා බලා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

ඉ.10 2023 වර්ෂයේ පොදු අරමුදලින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ද්‍රව්‍ය අධාර ලබාදීමට අදාළ පහත සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ප්‍රතිපාදන ඉල්ලුම් කරන මන්ත්‍රීතුමා /මන්ත්‍රීතුමිය | යෝජනාව | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 01 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අවශ්‍ය අභ්‍යාස පොත් හා පාසල් උපකරණ ලබාදීම | 300,000.00 |
| 02 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අවශ්‍ය අභ්‍යාස පොත් හා පාසල් උපකරණ ලබාදීම | 200,000.00 |
| 03 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා | අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ හා පොත් ලබාදීම | 300,000.00 |
| 04 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ.ජී.ස්වර්ණලතා මැතිතුමිය | 1.පල්ලේදිගල එක්සත් මරණාධාර සමිතියට ඇඳි රහිත පුටු ලබාදීම<br>2.දුනුවිල උතුර මැදවත්ත ශ්‍රී සද්ධර්ම රාජ මහා විහාර කාර්ය සාධක සමිතියට ඇඳි රහිත ප්ලාස්ටික් පුටු ලබාදීම<br>3.පල්ලේදිගල බෞද්ධ විද්‍යාලයට ජල ටැංකියක් ලබා දීම | 65,000.00<br>45,000.00<br>50,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.10 2023 වර්ෂයේදී ඉහත සංවර්ධන යෝජනා සඳහා පොදු අරමුදලින් මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමේ හැකියාව සලකා බලා විෂය භාර ගරු අමාත්‍යතුමා ලෙස මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව එම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

ඉ.11 2023 වර්ෂයට අදාළව අකුරණ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන හා සංවර්ධන කටයුතු සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2022.12.31 දිනෙන් අවසන් වූ අතර එම කාලය 2023.01.31 දින දක්වා දීර්ඝ කර පහත ගාස්තු අයකිරීම සුදුසු බවට යෝජනා කරමි.

- සැපයුම්කරුවන් ලියාපදිංචිය 1500.00.රු - (එක් අයිතමයක් සඳහා)
- කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 3000.00.රු - (එක් අයිතමයක් සඳහා)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.එම්.හස්වර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.11 2023 වර්ෂයට අදාළව අකුරණ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන හා සංවර්ධන කටයුතු සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2022.12.31 දිනෙන් අවසන් වූ බැවින්, එම කාලය 2023.01.31 දින දක්වා දීර්ඝ කර ඉහත ගාස්තු අයකිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.12** 2022 වර්ෂයට අදාළව ගිවිසුම්ගතවී ඇති නමුත්,මෙතෙක් වැඩ අවසන් නොකළ සංවර්ධන ව්‍යාපෘති සියල්ලෙහි වැඩ අවසන් කිරීමත් එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමේ කාලය 2023.01.31 දක්වා දීර්ඝ කිරීමත් සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඒ.එම්.සරත් අමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.12 2022 වර්ෂයට අදාළව ගිවිසුම්ගතවී ඇති නමුත්,මෙතෙක් වැඩ අවසන් නොකළ සංවර්ධන ව්‍යාපෘති සියල්ලෙහි වැඩ අවසන් කිරීමත් එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමේ කාලය 2023.01.31 දක්වා දීර්ඝ කිරීමත් සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ඊ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

## ඊ.1 මුදල් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් මස 02,09, 16, 23 සහ 30 යන දිනයන්හි පැවති මුදල් කමිටු වාර්තා මුදල් කමිටු ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

## ඊ.2 පරිසර කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් මස 20 දින පැවති පරිසර කමිටු වාර්තාව පරිසර කමිටු ගරු සභාපති එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

## ඊ.3 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් මස 22 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු ගරු සභාපති වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් සභාගත කරන ලදී.

## ඊ.4 කර්මාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් මස 22 දින පැවති කර්මාන්ත කමිටු වාර්තාව කර්මාන්ත කමිටු ගරු සභාපති ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා විසින් සභාගත කරන ලදී.

## ( උ) ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

## (ඌ ) වෙනත් කරුණු

**1.ගරු මහජන නියෝජිතයින්ගේ නිවාඩු අනුමත කිරීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඒ.අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා අද දින මහා සභාවට නොපැමිණෙන බව දුරකතනයෙන් දන්වා නිවාඩු අනුමත කර දෙන මෙන් සිදු කළ ඉල්ලීම ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**2. වෙනත් කරුණු**

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමා,

මෙය අපගේ අවසන් මහා සභාව විය හැකියි.අප මහා සභාවක් ලෙසින් සභා නීති රීති නිසි ලෙස පිළිපැදිය යුතු වෙනවා.සභාවට තේරිපත් වූ බොහෝ නවක මන්ත්‍රීවරුන්ගේ අඩු පාඩු රාශියක් තිබුණා.දමිළ භාෂාවෙන් පනතක් ලබා ගැනීම ඉතා අපහසු කාර්යයක් වුවත්,මම මුස්ලිම් ජාතික මන්ත්‍රීවරුන්ට දමිල භාෂාවෙන්ම මුද්‍රිත ප්‍රාදේශීය සභා කෙටුම්පත ගෙන්වලා දුන්නා.නමුත් ඔවුන් එය නිසි ලෙස පරිශීලනය කරාද යන ගැටලුව මට මතුවෙනවා.මහජන නියෝජිතයන් ලෙස අපට යම් වගකීමක් තිබෙනවා පනතේ ඇති නීති රීති රාමුව තුල සිට කටයුතු කිරීමට.මහජනතාවට අප විසින් ලබාදෙන තොරතුරු නිවැරදි විය යුතුයි.ඉදිරියටත් අප ප්‍රාදේශීය සභා දේශපාලනයට සම්බන්ධ වෙනවා නම් පනතේ ඇති මූලික නීති රීති ටික පිළිබඳව හෝ මනා අවබෝධයක් ලබා ගත යුතුයි.අප බලප්‍රදේශය තුල ඇති ප්‍රධාන නගරයක් වන අලවතුගොඩ නගරයට ඇති විශාලතම අඩු පාඩුවක් වන්නේ පොදු වැසිකිලියක් නොමැති වීමයි.විශේෂයෙන්ම ගරු උපසභාපතිතුමා,ගරු අල්විස් මන්ත්‍රීතුමා ආදී මන්ත්‍රීවරුන්ගේ උනන්දුව මත මේ වන විට ඒ සඳහා සුදුසු ස්ථානයක් සොයාගෙන රු.ලක්ෂ 40ක පමණ ඇස්තමේන්තුවක් ද සකස් කර තිබෙනවා.තවමත් එහි වැඩ කටයුතු ආරම්භ කර නොමැති වුවත්,ලේකම්තුමා විසින් මෙහි වගකීම ගෙන ඉදිරි කටයුතු සිදු කරයි කියා විශ්වාස කරනවා.එමෙන්ම අකුරණ නගරය ද ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන නගරයක් වුවත්, ඊට විශාල අභියෝගයක් වී ඇත්තේ ගංවතුරෙන් පිඩාවට පත් වීමයි.අප සභාවක් ලෙස 2018 වසරේ සිට ගංවතුර පාලනය සඳහා ක්‍රියාත්මක කළ වැඩපිළිවෙලවල් සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා.

අවාසනාවකට මෙන් අපට අපේක්ෂා කළ මට්ටම දක්වා ළඟාවිය නොහැකි වුණා.නමුත් ප්‍රාදේශීය සභාවක් ලෙසින් අපට එහි සම්පූර්ණ වගකීම භාර ගන්න බැහැ.එහිදී අප සතුවන සීමිත බලතල රාමුව ඔස්සේයි අදාළ කටයුතු සිදු කළ හැකි වූයේ.නමුත් ඇතැම් අවස්ථාවල අපි එම සිමාව ද ඉක්මවා ගොස් අපගේ දායකත්වය ලබා දී තිබෙනවා.පසුගිය දෙසැම්බර් මාසයේ ඇති වූ ගංවතුර තත්වය කිසිදා මෙතෙක් අත්නොවිදි අයුරින් අකුරණ ව්‍යාපාරික ජනතාවට විශාල වශයෙන් බලපෑම් එල්ල කළා.කෝටි 200ක පමණ අලාභයක් ඔවුන්ට ඉන් සිදු වුණා.ඒ අතරතුර සමාජ ජාල මාධ්‍ය ඔස්සේ ඇතැම් පුද්ගලයින් විවිධ අරමුණු මුදුන්පත කර ගැනීමේ චේතනාවෙන් ඒ සම්බන්ධයෙන් වැරදි ප්‍රචාරයන් පැතිරවීමට උත්සාහ දැරුවා.අද වන විට ඇතැම් ජාතික පුවත්පත් වල මෙන්ම වෙබ් අඩවි තුලින් ද එවැනි වැරදි ප්‍රචාරයන් ප්‍රචාරය වීමට පටන්ගෙන තිබෙනවා.එහිදී අප සභාවේ ගරු මන්ත්‍රිතුමන්ලා අතර සිටි එක්කෙනෙක් දෙන්නෙක් එම ගරු කියන වචනයට හානි වන සේ කටයුතු කරමින් සමාජයට වැරදි තොරතුරු ලබා දුන්නා.මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අප අකුරණ අස්නා මහා පල්ලියෙන් කැඳවනු ලැබුවා.ඒ සඳහා මා ඇතුළු සහෝදර මුස්ලිම් මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් සහභාගී වුවත්,මා මින් පෙර සඳහන් කළ එම පුද්ගලයා එදින ද එම සාකච්ඡාවට සම්බන්ධ වුණේ නැහැ.අදත් කෙසේ හෝ මෙතැනින් මඟහැර ගියා. ජනතාවට ඇතිවන දුක් පීඩාවන් මුල්කරගෙන දේශපාලන වාසි ලබා ගැනීම මා තරයේ හෙලා දකිනවා.කිසිදු ජාතිභේදයකින් තොරව සිංහල,ද්‍රවිඩ මුස්ලිම් ආදී සියලු ජනතාව අනෙකාගේ දුකේදී පිහිටවෙනවා.විශේෂයෙන්ම මෙම ව්‍යවසනයෙන් පසු කොනකලගල නායක ස්වාමින්වහන්සේ අකුරණ පල්ලියට රු.ලක්ෂ 2 ක මුදල් ආධාරයක් ලබා දී තිබෙනවා.උන්වහන්සේටත් වැටහුනා මෙවර ජනතාව විශාල ලෙසින් ගංවතුරෙන් පිඩාවට පත්වුණු බව.අපගේ ජනතාව එතරම් පිඩා විදිමින් සිටින අවස්තාවක දෙශපාලන වාසි ලබා ගැනීමට කටයුතු කිරීම හරිම වැරදියි.එමෙන්ම මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වූ අතර එයට ගරු හලීම් මැතිතුමා ද සහභාගීවුණා.එහිදීද මා කලින් සඳහන් කළ පුද්ගලයා විසින්ම වැරදි තොරතුරු ලබා දී එතුමා නොමඟ යවමින් එතුමන් ලවා අප සභාවට එරෙහිව කතා කරවීමට සැලැස්වූවා.එය එවැනි අවස්තාවක සිදු නොකළ යුතු ක්‍රියාවක්.අප අතර කුමන පාට පක්ෂ භේද තිබුනත්,එහිදී ජනතාවට සේවයක් කිරීමේ අරමුණින් තමයි කටයුතු කළ යුතු වන්නේ.එමෙන්ම එදා පල්ලියෙන් ඉල්ලීමක් සිදුකළා මුස්ලිම් මන්ත්‍රීවරු සියලුදෙනාම එක් තැනකට රැස්වී සභාපතිවරයා විසින් ප්‍රකාශයක් සිදු කළ යුතු බවටත්,අනතුරුව එම වීඩියෝපටය පල්ලියට ලබා දෙන ලෙසටත්.අද දින මහා සභාව පැවැත්වීමෙන් පසුව එම ප්‍රකාශය සිදු කරන බැවින්,ගරු සිංහල මන්ත්‍රීවරුන්ද ඒ සඳහා අප සමග එක්වන ලෙස ඉල්ලා සිටිනවා.එමෙන්ම ගොඩනැගිලි ඉදිකිරිම සම්බන්ධයෙන් යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍යවේ නම් මහා සභාව අවසානයේ ඒ සම්බන්ධයෙන් ඇති නීති රීති ආදිය පැහැදිලි කිරීමට ලේකම්තුමා සූදානමින් සිටිනවා.එදා මා විසින් පල්ලියේදී ඒ සම්බන්ධයෙන් දමිල භාෂාවෙන් සම්පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කළා.1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 46 - 65 වන වගන්තිය දක්වා සඳහන්ව ඇත්තේ ඉදිකිරිම් සම්බන්ධවයි.1999 මාර්තු 04 වනදා පලකල අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපගේ භූමි භාගය ඔවුන් වෙත පවරාගෙන තිබෙනවා.එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ ඇතැම් බලතල සභාපතිවරයා වෙත ලබාදී ඇති බැවින්,සභාපතිවරයාට ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කළ නොහැකියි.ඒ අනුව යම් අනවසර ඉදිකිරීමක් සිදු කිරීමේදී අපට කෙලින්ම ඊට විරුද්ධවිය නොහැකියි.නිවේදනය යැවීම,සති 2 ක කාලයක් ලබා දීම,නඩුවක් ගොනු කිරීම හැරුනුවිට එම ඉදිකිරීම් නවතා දැමීමේ හැකියාවක් අප සතුව නැහැ.අනතුරුව උසාවියෙන් ලැබෙන තීරණය තමයි අපට ක්‍රියාත්මක කළ හැකි වන්නේ.නමුත් එලෙස ගොනුකරන ලද නඩු බොහොමයකට ලබා දී ඇති නඩු තීන්දු සම්බන්ධයෙන් අපට සෑහිමකට පත් විය නොහැකියි.විශේෂයෙන්ම බර්ගර් හට් නඩු තීන්දුව දෙස බැලීමේදී 2010 දී සභාවෙන් නඩුව ගොනු කර 2012 දී එහි නඩු තීන්දුව ලබාදී තිබෙනවා.එම තීන්දුව පිළිබඳව අපට සෑහීමකට පත් විය නොහැකි වුවත්,අපට එම තීරණයට එකඟවීමට සිදුවෙනවා.එවැනි වාතාවරණයක් හමුවේ අපට නැවතත් ඔවුන්ට නඩුවක් ගොනු කළ නොහැකියි.ඇතැම්

අවස්ථාවල ප්‍රාදේශීය සභාවෙන් නඩු ගොනු කරන ලද අනවසර ඉදිකිරීම්වලට නාගරික සංවර්ධන අධිකාරියේ බලතල අනුව යම්කිසි දඩ මුදලක් අයකරගෙන ඔවුන් ඉන් නිදහස් කර තිබෙනවා.ඇතැම්විට සභාපතිවරයා මුල්වී බලප්‍රදේශය තුළ සිදුකරන එවැනි අනවසර ඉදිකිරීම් නැවැත්වීමට කටයුතු කිරීමේදී ඉහළින් ඇතිකරන දේශපාලනික බලපෑම් මත එම ක්‍රියාදාමයන් නවතා දැමීමට සිදුවූ අවස්ථා මීන් පෙර සිදුව තිබෙනවා.අකුරණ ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින්මයි මෙම ඉදිකිරීම් සිදු කරන්නේ.එබැවින් අප අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කළ යුතුයි.1999 වසරේදී අප බලප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දීමට මහා සභා තීරණය ලබා ගැනීමේදී ද සභාව පිළිබඳව වැරදි තොරතුරු ලබා දෙන බවට මා කලින් සඳහන් කළ මන්ත්‍රීවරයාත් මෙම සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කර තිබෙනවා.නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දීමේදී අකුරණ නගරය දියුණු කරන ආකාරය පිළිබඳව සැලසුමක් ඔවුන්ගෙන් ලබාගත යුතු වුවත්,1999 වසරේ සිට මේ දක්වාත් ඔවුන් අපට එවැනි නගර සැලසුමක් ලබාදීලා නැහැ.අකුරණ බලප්‍රදේශය තුළ අපගේ දරුවන්ට ක්‍රීඩා කිරීමට පොදු ක්‍රීඩාපිටියක් නැහැ.දරුවන් වෙනුවෙන් කළයුතු සේවයන් අපගෙන් ඉටු නොවීම හේතුවෙන් අද වන විට තරුණ ප්‍රජාව බොහෝ සෙයින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවී සිටිනවා.ජනතාව පීඩා විඳින මෙවැනි ගැටලුවලින් දේශපාලන වාසි ගැනීම වෙනුවට,අප කලයුතු වන්නේ ඒ සඳහා නිසි විසඳුම් ලබාදීමයි.මා මීන් පෙර සඳහන් කළ මන්ත්‍රීවරයාගේ පක්ෂය නියෝජනය කරනු ලබන ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුන් මෙහි සිටින බැවින්,මම එතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා එම තත්වය එම මන්ත්‍රීතුමාට තේරුම් කර දෙන ලෙසට.අකුරණට බලපෑ ගංවතුර තත්වය සම්බන්ධයෙන් සොයා බැලීමට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමන්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් මේවන විට යොදවා ඇති අතර,මීළඟ බ්‍රහස්පතින්දා සිට ඔවුන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර මීට අදාළ කටයුතු ආරම්භ කිරීමට නියමිතයි.එහිදී එම කටයුතු නිසි ලෙස සිදුකිරීමට ජනතාවගේ සහය ඔවුන් වෙත ලබාදීමට අප මැදිහත් වී කටයුතු කලයුතු බැවින්,ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය නොමඳවම ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා,

ප්‍රවාහනයේදී මස් ලොරි තුළ එල්ලා ගෙන යායුතු බවත්,එසේ නොවුනහොත් බලපත්‍ර නිකුත් නොකරන බවත් මහජන සෞඛ්‍යය පරීක්ෂකවරුන් විසින් පවසා තිබෙනවා.නමුත් පසුගිය පරිසර කමිටුවට සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් එවැනි යෝජනාවක් ඉදිරිපත් කර තිබුනේ නැහැ.එබැවින් එම යෝජනාව ලබන වසරේ සිට ක්‍රියාත්මක කරන ලෙසත්,එතෙක් මෙම වසරට අදාළව එම ව්‍යාපාරිකයන්ට අදාළ මස් ප්‍රවාහන බලපත්‍රය ලබා දෙන ලෙසට ඔවුන් සමග සාකච්ඡා කර තීරණයකට එළඹෙන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.ගරු හලීම් මැතිතුමා අපගේ ගරු මන්ත්‍රීවරයෙකුගේ පෙළඹවීමකට අනුව සභාවට විරුද්ධව කථා කළ බව ඔබතුමා විසින් ප්‍රකාශ කර සිටියා.මා වෙත තොරතුරු ලැබී ඇති පරිදි අකුරණ නගරයේ ගොඩනැගිලි 198 ක් අනවසර ඉදිකිරීම් යැයි හඳුනාගෙන කඩා ඉවත්කරන ලෙසට නියෝග කර තිබෙන බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමා,

2014 වසරේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සිදුකළ පරීක්ෂාවකට අනුව ඔවුන් විසින් ඒ කාලයේදී ප්‍රාදේශීය ලේකම්වරයාට නිර්දේශයක් ලබාදී තිබෙනවා යම්කිසි ගොඩනැගිලි කිහිපයක් කඩා ඉවත්කළ යුතු බවට.එහිදී මතුවන ගැටළුව නම් එම නිර්දේශය ප්‍රාදේශීය ලේකම්වරයාට ක්‍රියාත්මක කළ නොහැකි වීමයි.ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට එම නිර්දේශය ලබාදිය හැකි වන්නේ නාගරික සංවර්ධන අධිකාරියටයි.ඒ අනුව ඔවුන්ට ප්‍රාදේශීය සභාවට ද එවැනි නිර්දේශයක් ලබාදිය නොහැකි අතර,අපට කුමන ආයතනයකින් හෝ එවැනි නියෝගයක් ලැබී නොමැති බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා,

නමුත් එම නියෝගය පදනම් කරගෙනයි ගරු හලීම් මැතිතුමා එවැනි ප්‍රකාශයක් සිදුකර තිබෙන්නේ.එතුමා සිතා සිටින්නේ අනවසර ගොඩනැගිලි 198 ක් හදුන්වා දී තිබියදීත් සභාවෙන් එම ගොඩනැගිලි ඉවත් කිරීමට කටයුතු නොකළ බවයි.ගරු සභාපතිතුමා එතුමාට එම තත්වය එම අවස්ථාවේදීම පැහැදිලි කර දුන්නා නම් එවැනි ගැටළුවක් ඇති වන්නේ නැහැ.බර්ගර් හට් එකට අදාළ නඩුවේදී නඩු දමා තිබෙන්නේ එහි හිමිකරුට නොව,ව්‍යාපාරය සිදු කරන පුද්ගලයාටයි.නඩු තීන්දුව අනුව ඊට අදාළව අයකරගෙන තිබෙන්නේ රු.2250.00ක දඩ මුදලක් පමණයි.සභාවෙන් අනවසර ගොඩනැගිලි 198 සඳහාම නඩු ගොනු කළත්,අවසානයේ සිදුවන්නේ එවැනිම දෙයක් බව පෙන්වා දෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමා,

මම ගරු හලීම් මැතිතුමාට කිසිදු ආකාරයකින් චෝදනා කළේ නැහැ.එතුමා එම ප්‍රකාශය සිදු කරන ලද්දේ කාගේ හෝ පෙළඹවීමකට අනුව බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා,

මෙතෙක් කාලයක් අකුරණ සභාවේ කුමන මතවාද පැවතියත් අප සියලුදෙනාම එක් මතයකට පැමිණ හොඳ තීන්දු තීරණ ලබාගෙන සභාවක් ලෙසින් ඍජුව සිටගෙන කටයුතු කළා.එබැවින් එම තත්වය මේ අවසන් කාලයේදී නැතිකර නොගන්නා ලෙස ඉල්ලා සිටිනවා.අකුරණ මුස්ලිම් ප්‍රජාව ලෙසින් ලැජ්ජා විය යුතු කරුණක් මා මේ ටිකේ අපගේ මුස්ලිම් ගරු මන්ත්‍රීවරුන්ගෙන් දකිනවා.සාමාන්‍යයෙන් මුස්ලිම් ප්‍රජාව යනු සමගියෙන් කටයුතු කරන පිරිසක් ලෙසයි අප දකින්නේ.නමුත් මේ දිනවල එම තත්වය මදක් වෙනස්ව ඇති ස්වරූපයක් දක්නට ලැබෙනවා.ගරු සමීම් මැතිතුමා යනු පොදුවේ මුස්ලිම් සිංහල යන සියලුදෙනාගේම ආදරය දිනාගත් නායකයෙක්.එතුමා එදා අකුරණට හොඳ නායකත්වයක් ලබා දුන්නා.එලෙසම අද වන විට අපගේ ගරු ඉස්තිහාර් මැතිතුමා ද සභාපතිවරයා වශයෙන් හොඳ නායකත්වයක් ලබාදෙනවා.එතුමා සම්බන්ධයෙන් යම් යම් විවේචනයන් හෝ දෝෂාරෝපණයන් තිබෙනවා නම් අපි එවැනි දේ සභාව තුලදීම කතාබහ කර අවසන් කරගත යුතුයි.එය සභාවෙන් එපිට සමාජය දක්වා රැගෙන ගොස් එතුමාට කුමන්ත්‍රණකාරී ලෙස මඩ ප්‍රහාර හා දෝෂාරෝපණයන් එල්ල කිරීම අපගේ දේශපාලනයට මෙන්ම මන්ත්‍රීධුරයට ද ගැලපෙන්නේ නැහැ.තම පෞද්ගලික ධනය පවා වියදම් කරමින් ජනතාවට සේවය කරන පුද්ගලයෙකු ලෙස ගරු සභාපතිතුමාට විවිධ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ එල්ල කරනු ලබන ඇතැම් චෝදනාවන් ඇත්තෙන්ම අසත්‍ය බව අප සියලුදෙනාට හොඳින්ම වැටහෙනවා.එබැවින් දේශපාලන අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අසත්‍ය ලෙසින් චරිත ඝාතනය කිරීම තරයේ හෙලා දකිනවා.කුමන පාට පක්ෂ නියෝජනය කළත්,තම ජාතිය ආගම පෙරදැරිව මනා විනයකින් යුතුව කටයුතු කළහොත් පමණයි අපට පැහැදිලි ඉදිරි ගමනක් යා හැකි වන්නේ.අකුරණ බලප්‍රදේශයට නියම නායකයකුගේ අඩුවක් තිබෙනවා.එබැවින් අපගේ ගරු සභාපතිතුමා නැවතත් දේශපාලනයට පැමිණිය යුතුයි.එතුමාට මුස්ලිම් සිංහල යන දෙපිරිසගේම සහයෝගය නොඅඩුව ලැබෙනවා.මීළඟ මැතිවරණයෙන් කුමන පුද්ගලයෙක් සභාපතිවරයා බවට පත්වුවත්,එතෙක් දේශපාලන වාසි තකා අසත්‍ය ප්‍රචාරයන් ඔස්සේ චරිත ඝාතනය කිරීම නොකළ යුතුයි.එහිදී මුස්ලිම් මන්ත්‍රීවරුන් ලෙසින් ඔබතුමන්ලා ඊට නායකත්වය ලබාදිය යුතුයි.ගරු හලීම් මැතිතුමා එම ප්‍රකාශය සිදුකරන අවස්ථාවේ මමත් එහි සිටියා.එහිදී සුළු වැරදීමකින් එතුමා අතින් වැරදි දෙයක් කියවුණා.අප ඉදිරියේම එතුමා කියා සිටියා මේ සියල්ලටම වගකිවයුත්තේ ප්‍රාදේශීය සභාව වන බවට.සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු ලෙසින් ඔවුන් එහිදී අපිව වරදක් කළ පුද්ගලයින් ලෙසින් දකින බැවින්,අපිත් එහිදී ඒ සම්බන්ධයෙන් කථා කළා.එවිට ඔවුන්ද එය පිළිගෙන නිහඬව සිටියා.අප එහිදී මත ගැටුමක් ඇති නොකරගෙන එය නිවැරදි කළා.අකුරණ සභාව තුළ ගරු සුලෙයිමන් සභාපතිතුමාගේ සිට මේ දක්වාම සිටියේ මුස්ලිම් සභාපතිවරුයි.ඔවුන් සියලුදෙනාමත් අකුරණ නගරයට ඍජුවම සම්බන්ධ පුද්ගලයන්.ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා විසින් ඇල ආශ්‍රිතව ඉදිකර තිබූ ගොඩනැගිලි ඉවත්කිරීමට සූදානම් වූ අවස්ථාවේ එයට විරුද්ධ වූයේ ද මුස්ලිම් දේශපාලන නායකත්වයක්.දේශපාලනය තුළ ඇති ඉතිහාසය පිළිබඳව නිතරම අධ්‍යනය කරමිනුයි අප කටයුතු කළයුත්තේ.එබැවින් අප මේ සියලු කරුණු පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කලයුතු අතර,ඉදිරියේදී නැවත මෙම සභාවට පත්වීමට අපේක්ෂා කරන්නේ නම් දේශපාලනය තුළ තිබිය යුතු විනය මනා ලෙසින් ගොඩනගාගෙන ඉදිරි ගමනක් කරා යැම සුදුසු බව පෙන්වා දෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.එස්.එම් හුසෙයින් මැතිතුමා,

පසුගිය සතියේ ඇදහැළුණු ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර තත්වයෙන් අකුරණ නගරයේ ජනතාව බෙහෙවින් පීඩාවට පත්වුණා.අකුරණ ව්‍යාපාරික ජනතාවට මිලියන් කෝටි ගණනින් පාඩු සිදුවුණා.මෙහි වගකීම සභාව

පිට පටවා අපට දෝෂාරෝපණ එල්ල කිරීම පහසු කාර්යයක් වුවත්,එය අකුරණට පමණක් සිදුවූ ව්‍යවසනයක් නොවෙයි.මේ හේතුවෙන් දුනුවිල ප්‍රදේශයේ ජීවිත 2ක් ද බිලිගත්තා.එම පවුලේ අයට අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.මා නියෝජනය කරනු ලබන වසමේත් ගෙවල් 16 ක පමණ බිත්ති කඩාගෙන ගොස් හානි සිදුවූ අතර,එහිදී ගරු අමරජීව මන්ත්‍රීතුමා විසින් එම මාර්ගයට වැටුණු පස් ඉවත්කිරීම සඳහා ඩෝසර් යන්ත්‍රය ලබාදීම සම්බන්ධයෙන් ස්තූතිය පළකර සිටිනවා.රඹුකේඇල ප්‍රදේශයේ එලෙස කඩා වැටුණු බොහෝ පස් තවත් ඉතිරිව ඇති බැවින්,එම පස් ඉවත්කර එම ජනතාවට සහනයක් සලසන ලෙස ඉල්ලා සිටිනවා.මහජන නියෝජිතයෙක් ලෙස දේශපාලන අරමුණු මුදුන්පත් කරගැනීම උදෙසා අනෙක් අය කොටවමින් කටයුතු කිරීම පිළිබඳව නොව,තමාගෙන් ජනතාවට සිදුවූ සේවය පිළිබඳව සතුටු වීමේ හැකියාව අපට තිබිය යුතුයි.එබැවින් සියලුදෙනා තුළම සාමය සමගිය වර්ධනය වී අප සියලුදෙනාටම එක්ව ගංවතුරෙන් පීඩා විඳි ජනතාවට සේවයක් සිදු කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන බව
ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා,

සභාව නියෝජනය කරනු ලබන මුස්ලිම් මන්ත්‍රීවරුන් 20 දෙනෙකු සිටියත්,වැරදි සිදුකරන එක් අයෙක් හේතුවෙන් සියලුදෙනාටම චෝදනා නොකරන ලෙස ඉල්ලා සිටිනවා.ගංවතුර හේතුවෙන් කුරුගොඩ රෝහල පාර සහ ගලහතුඩු මාර්ගය සම්පූර්ණයෙන්ම යටවී කඩාගෙන ගොස් මේ වන විට ජනතාවට එහි ගමන් කළ නොහැකි තත්වයකට පත්ව තිබෙනවා.එමෙන්ම දෙල්ගස්ගොඩ ප්‍රදේශයේ එක් නිවසකට කොස් ගසක් කඩා වැටීමෙන් අලාභහානි සිදුව තිබෙන අතර,කුරුගොඩ නිවසක වැසිකිලියක් සම්පූර්ණයෙන්ම කඩාගෙන ගොස් හානි සිදුව තිබෙනවා.මේ ආකාරයෙන් අකුරණ නගරයේ ජනතාව මෙන්ම ඇතුළු ගම්වල ජීවත්වන දුප්පත් ජනතාව ද මින් විශාල ලෙස පීඩා විඳිනවා.සභාව විසුරුවා හැරීමෙන් පසු ලේකම්තුමාගේ මූලිකත්වයෙන් හෝ එම මාර්ග සුද්ධ පවිත්‍ර කර ඔවුන් සඳහා අවශ්‍ය සහන සැලසීම් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.පාට පක්ෂ භේදයකින් තොරව අප සියලුදෙනාමත්,ව්‍යාපාරිකයන් සියලුදෙනාමත් මෙහිදී එකමුතුව කටයුතු කළහොත් අකුරණ නගරය මෙම තත්වයෙන් මුදවාගත හැකි වන්නේ.එබැවින් අප සියලුදෙනාම එක්ව නාගරික සංවර්ධන අධිකාරිය මගින් පත්කර ඇති නිලධාරී මණ්ඩලයට සහයෝගය ලබාදී අකුරණ නගරය වෙනුවෙන් හොඳ දෙයක් කරමු යැයි ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.ගාමිණී වසන්ත කුමාර මැතිතුමා,

පසුගිය සතියේ ඇති වූ ධාරානිපාත වර්ෂාව හේතුවෙන් දුනුවිල ප්‍රදේශයේ පස් කන්දක් කඩා වැටී ජීවිත 2ක් අහිමි වුණා.ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන අතර,සභාව විසුරුවා හැරියත් ඔබතුමන්ලාගේ දායකත්වයෙන් හා සභා ලේකම්ගේ අවධානය යොමු කර එම නිවස නැවත පිළිසකර කර ගැනීමට අවශ්‍ය සහය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිරිමල් විජේතුංග මැතිතුමා,

1997 වසරේ සිට සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයෙකු ලෙස මා හොඳින්ම දන්නවා ගරු සභාපතිතුමා පැවසූ පරිදි අනවසර ඉදිකිරීම් සිදුකරන විට අපගේ නිලධාරීන් නිහඬකර ඒවාට ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ නොදුන් ඉහළ දේශපාලඥයින් සිටි බව.නමුත් මෙම වසර 5 තුළ තමයි අපගේ ගරු සභාපතිතුමා කිසිදු දේශපාලඥයෙකුට යටත් නොවී ඍජුව කටයුතු කරමින් අනවසර ඉදිකිරීම් සිදුකිරීම පාලනය කරන ලද්දේ.එය අප සියලුදෙනාටමත් ආඩම්බරයට කරුණක් බව ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා,

පසුගිය සතියේ ඇදහැළුණු ධාරානිපාත වර්ෂාව හේතුවෙන් අකුරණ නගරය මෙන්ම රටේ සෙසු ප්‍රදේශ වලට ද බොහෝ සෙයින් අලාභහානි සිදුවුණා.ඉන් අකුරණ ව්‍යාපාරික ප්‍රජාවට කෝටි ගණනින් පාඩු සිදුවූ අතර,දුනුවිල ප්‍රදේශයේ ජීවිත 2ක් ද අහිමි වුණා.මෙය වසර ගණනාවකට පසුව ඇතිවූ ආපදා තත්වයක්.නමුත් අප මින් පෙර මීට නිසි තීන්දු තීරණ ගෙන තිබුණා නම් ඉන් ඇතිකරන ව්‍යවසනයේ ප්‍රමාණය මීට වඩා අවම කරගත හැකිව තිබුණා.විලාන රඹුකේඇල ප්‍රදේශයට ද මින් විශාල ලෙස අලාභහානි සිදුවුණා.අලවතුගොඩ අංකුඹුර මාර්ගය සභාවට අයත් මාර්ගයක් නොවුණත්,මා පෞද්ගලිකව මුදල් ගෙවා කුලියට පවා යන්ත්‍ර යොදවා දින කිහිපයක්ම එම මාර්ගයට

වැටී තිබුණු පස් ඉවත් කිරීම සිදු කළා.මීට හේතු වූයේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මාර්ගය කැපීමේදී අනුගමනය කළ වැරදි ක්‍රමවේදයයි.මේ හේතුවෙන් ඇල්ලවල් කඩාගෙන ගොස් බෝක්කු සියල්ල වැසී ගිය අතර,වැසි ජලය මාර්ගය කරා ගලා යන්නට වුණා.එහිදී ඉඩම්වල ඉවුරු කඩාගෙන ගොස් නිවාස ද යටවුණා.සභාව ද ඒ පිළිබඳව ක්‍රියාත්මක නොවී සිටීම වරදක්.පන්සලතැන්න ජනපද මාර්ගයේ ඇති බෝක්කු 7 ම මේ වන විට වැසී ගොස් තිබෙන්නේ.ඒ හේතුවෙන් වතුර පහර සියල්ල ගලාගෙන යන්නේ පාර දිගේ.අප නිහඬව සිටියහොත් ඉවුරු කඩා වැටී නිවාස වලට හානි සිදුවෙයි.අවසානයේ එහි වරදකරුවන් වන්නේත් සභාවයි.එබැවින් ඉදිරි කාලය තුළදී හෝ අප මේවා විධිමත් කිරීමට කටයුතු කළ යුතුයි.නමුත් හැකි උපරිමයෙන් බලප්‍රදේශය වෙනුවෙන් යම්කිසි වැඩ කොටසක් ඉටු කිරීමට හැකියාව ලැබීම පිළිබඳව අප සතුටු විය යුතුයි.අප විසින් මේ වන විටත් බලප්‍රදේශයේ බොහෝ මාර්ග සකස් කර ඇති බැවින්,ඉදිරියේදී සභාවට පත්වන සභිකයින්ට සිදු කිරීමට ඇත්තේ එම මාර්ග වලට තාර දැමීම,බෝක්කු දැමීම වැනි සුළු වැඩ කොටසක් පමණයි.ආරම්භයේ සිට මේ දක්වා ඒ සඳහා අඩිතාලම දැමූ සියලුම ගරු සභාපතිවරුන් මා මෙහිදී ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.වසර 22 ක් වන මාගේ දේශපාලන ජීවිතය දෙස ආපසු හැරී බලන විට මා හට ජනතාව වෙනුවෙන් සිදුකළ හැකි සේවාව උපරිමයෙන් සිදු කළා යැයි සතුටු විය හැකියි.එමෙන්ම මා මෙහිදී ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා අදින් පසුව අප සභාව තුළ නොසිටියත්,නැවත මහජන නියෝජිත කණ්ඩායමක් පත්ව එන තුරු මෙම සියලු වගකීම් නිසියාකාරව ඉටු කරමින් අපගේ සභා දේපල ආරක්ෂා කරමින් නිසි පරිපාලනයක් ගෙන යන ලෙසට.මෙතෙක් අපගේ සියලු කටයුතු සඳහා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයත් ලබා දුන් සහයෝගය ඉතා අගය කර සිටින බව ප්‍රකාශ කර සිටින ලදී.

(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.එම්.හස්වර් මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.ජී. නිල්මිණි දමයන්ති මැතිතුමිය පෙ.ව 11.05 ට පමණ ගරු මහා සභාවේ අවසරය ලබාගෙන සභා ගර්භයෙන් පිටව යන ලදී.)

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා,

අකුරණ නගරයට ගංවතුරෙන් සිදු වූ අලාභානිය පිළිබඳව අප සියලුදෙනාම කණගාටුවට පත්වෙනවා.මේ සියල්ලටම වගකිවයුතු වන්නේ අප සියලුදෙනායි.2011- 2012 පමණ කාල වකවානුව තුළයි අඩි 10ක කන්ටේනර් එකක් යොදවා එම ස්ථානයේ බර්ගර් හට් එක සාදන ලද්දේ.ඒ කාලයේ අධිකරණ ඇමති ලෙස කටයුතු කරන ලද්දේ ද මුස්ලිම් ජාතික අමාත්‍යවරයෙකු වූ බැවින්,එතුමන්ගේ සහය ද ඒ සඳහා ලැබී තිබෙනවා.මේ වන විට 8 කණුව ප්‍රදේශයේත් අනවසර ඉදිකිරීමක් සිදුවෙනවා.නමුත් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ නාගරික සංවර්ධන අධිකාරියේත් අනුදැනුම මතයි මේවා සිදුවෙන්නේ.එබැවින් අපිත් ඒවාට විරුද්ධව කථා කරන්නේ නැහැ.මහජන නියෝජිතයන් ලෙස අප ගොස් එම වරද පෙන්වා දෙනවා නම් එම ඉදිකිරීම තවදුරටත් සිදුකරන්නේ නැහැ.එසේ නොකර එම අවස්ථාවේ නිහඬව සිට පසුව ජනතාව මත වරද පැටවීම සුදුසු වන්නේ නැහැ.දිගින් දිගටම අප මේ අයුරින් කටයුතු කළහොත් ඉදිරියේදී විශාල ගැටළුවක් ඇතිවිය හැකි බැවින්,අප මින් ඉදිරියට හෝ නිවැරදි විය යුතුයි.බලප්‍රදේශය නියෝජනය කරනු ලබන කෙතරම් මැති ඇමතිවරු,මන්ත්‍රීවරුන් සිටියත් මෙම තත්වය පාලනය කිරීමට නොහැකි වී තිබෙනවා.දුනුවිලෙන්,පන්ගොල්ලාමඩින් සහ ඕවිස්ස වැනි ප්‍රදේශවලින් එන වතුර පහර මගදී අමුණු ඉදිකර පාලනය කිරීමට යම් ක්‍රමවේදයක් සැකසිය යුතුයි.එවැනි ක්‍රමවේදයක් සකස් කළහොත් එම තත්වය පාලනය වනවා සේම එම ජලයෙන් කෘෂිකර්ම ආදී කටයුතු වලට ද ප්‍රයෝජනයක් ලබා ගත හැකියි.අතීතයේ සිට මේ සඳහා විවිධ යෝජනා ඉදිරිපත් වුවත්,මේ දක්වා ඒ කිසිවක් ක්‍රියාත්මක වූයේ නැහැ.එබැවින් ඉදිරියේදී හෝ අනවසර ඉදිකිරීම් සිදුවන විට මහජන නියෝජිතයින් ලෙස ඊට එරෙහිව කථා කර,මෙම තත්වය යම් මට්ටමකින් හෝ පාලනය කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.අපගේ ගරු මන්ත්‍රී මණ්ඩලය සභාවේ සෑම කටයුත්තකදීම ඉතාමත් සහයෝගයෙන් යුතුව කටයුතු කළා.එමෙන්ම ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයත් අප සමඟ ඉතා සහයෝගයෙන් අපගේ සියලු කටයුතු කරගෙන යාමට සහය දැක්වූවා.තවද අපගේ ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් බල ප්‍රදේශයට විශාල අභියෝගයක්ව පැවති කසල ගැටලුව විසඳීම ආදී කාර්යයන් බොහොමයක් සිදුකර තිබෙනවා.ඇත්තෙන්ම එතුමාටත් ලොකු සතුටක් දැනෙයි තමන්ගෙන් බල ප්‍රදේශයට විශාල සේවයක් සිදුකලා කියලා.එමෙන්ම අපට ද හොඳ සභාපතිවරයෙකු යටතේ වැඩ කිරීමට හැකියාව ලැබීම පිළිබඳව සතුටට පත්විය හැකියි.අප බොහෝ කාලයක් මුළුල්ලේ සිදුකරන ඉල්ලීමක් වන අලවතුගොඩ නගරයට පොදු වැසිකිලියක් සෑදීම සඳහා ගරු සභාපතිතුමාගේ අවධානය යොමු වී තිබෙනවා.ඔබතුමාගේ කාලයේදී හෝ එම කටයුත්තට මුල පිරීම සම්බන්ධයෙන් සතුටට පත්වෙනවා.ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුකිරීමේදී ද අනෙකුත් අපේක්ෂකයන්ට මඩ නොගසා එම ප්‍රචාරණ කටයුතු නිසි ලෙස සිදු කළහොත් අප සැමදෙනාටම නැවතත්

මෙම සභාව වෙත පත්ව පැමිණිය හැකියි.එහිදී ඍජුව කොන්දක් තබාගෙන වැඩ කළ හැකි මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී බී.කේ.ජී.සීලවතී මැණිකේ මැතිතුමිය,

ප්‍රාදේශීය සභා මාර්ග වල බෝක්කු වැසී යාම හේතුවෙන් මාර්ග දිගේ ජලය ගලාගෙන ගොස් බොහෝ දුරට බැම්මවල් කඩාගෙන ගොස් තිබෙනවා.එබැවින් වැසී තිබෙන බෝක්කු ටික සුද්ධ පවිත්‍ර කරගත්තොත් අපට පාරවල් ටික ආරක්ෂා කරගත හැකි වෙයි.එමෙන්ම දීගල සුසාන භූමියේ ඇති අනතුරුදායක කොස් ගස් 2ක ඉවත්කර දෙන ලෙසට මා විසින් මින් පෙරත් ප්‍රජා සංවර්ධන කමිටුවේදී මතක් කර සිටියා.එම නිවාස අසල ඇති ඇල්ල කඩාගෙන විත් නිවසට හානි සිදුවී තිබෙනවා.එබැවින් කොස් ගසේ අතු කඩාගෙන වැටුණහොත් එම නිවසට තවත් හානි සිදුවිය හැකියි.එබැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර එම ගස් ඉවත්කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම අකුරණ ව්‍යාපාරික ප්‍රජාවට ගංවතුර තත්වය හේතුවෙන් ඇති වූ පීඩාව සහ පාඩුව සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කර සිටින අතර,අපගේ මෙම සභා කාලය තුළ කටයුතු සිදුකරගෙන යාමේදී ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට හෝ ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට මාගේ වචනයකින් හෝ යම් වරදක් සිදුවූවා නම් ඒ පිළිබඳව සමාව ඉල්ලා සිටින බව ප්‍රකාශ කර සිටින ලදී.

## (එ) ඉදිරි මහා සභා දිනය තීරණය කිරීම

- ඉදිරි මහා සභා දිනය 2023 පෙබරවාරි 02 වන දින බව සභාවට දැනුම් දෙන ලදී.

## (ඒ) මහා සභාව අවසන් කිරීම

එදිනට නියමිත න්‍යාය පත්‍රයේ කටයුතු අවසන් වූ බැවින් පෙ.ව 11.30 ට මහා සභා කටයුතු අවසන් විය.